සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය I - II	කාලය நேரம் Time	පැය 3 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අමතර කියවීම් කාලය - මි. 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

අංක 1සිට 5 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප** අර්ථය දෙන උත්තරය තෝරන්න.

(1) සිරිමල් සමග **දිවෙන් දිව ගාගෙන** මෙන් සුනිමල් කටයුතු කළේ ය.

1. එකිනෙකාට රහසින් අනුබල දෙමින්
2. දැඩි මිතුරු බවින් කටයුතු කිරීම
3. එකඟතාවකට පත් නොවී කටයුතු කිරීම
4. නොරිස්සුම් ස්වභාවයෙන් කටයුතු කිරීම

(2) ක්‍රීඩා තරගය ගැන ඇසූ ඔහුගේ **මූණ ඇඹුල් වුණා** යැයි සංවිධායක පැවසී ය.

1. අධික සතුටට පත් විය
2. ලැජ්ජාවකට පත් විය.
3. අසතුටට පත් විය.
4. ආඩම්බර විය.

(3) සෑම අවස්ථාවක දී ම තම සේවකයන් **දඩමීමා කර ගෙන** ආයතන ප්‍රධානියා කටයුතු කළේ ය.

1. සුදුසු ලෙස යොදා ගැනීමට
2. වෙහෙසට පත් කිරීමට
3. යහපත් ලෙස යොදා ගැනීමට
4. අයෝග්‍ය ලෙස යොදා ගැනීමට

(4) **වැලේ වැල් නැතුව සිටි තමාට දැන්** හොඳ කාලයක් උදා වී ඇති බව ඔහු පැවසී ය.

1. අත මිට සරු කාලයක්
2. ආර්ථික අමාරුකම් ඇති ව
3. විශාල ධනයක් සහිත ව
4. එල්ලීමට ආධාරකයක් නැති ව

(5) සභාපතිගේ **මුනිවත රැකීම** සාමාජිකයන්ට ගැටලු සහගත විය.

1. ඉවත බලාගෙන සිටීම
2. නොසන්සුන් වීම
3. නිශ්ශබ්ද ව සිටීම
4. කරබාගෙන සිටීම

Past Papers Wiki

- අංක **6** සිට **9** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(6) සාහිත්‍ය නිර්මාණයක සාර්ථකත්වයට නිර්මාණකරුවාගේ ..... බලපායි.
1. අපූර්වත්වය 2. පරිශීලනය 3. පරිකල්පනය 4. විචාරය

(7) භාෂාව සංස්කෘතියේ ..... නිරූපණය කරන සාධකයකි.
1. අනන්‍යතාව 2. පරිණාමය 3. විකාශනය 4. ගෞරවය

(8) ඕනෑ ම ආයතනයක නිරතුරු ව තොරතුරු.....විය යුතු ය.
1. අන්තර් කාලීන 2. අර්ධ කාලීන 3. යාවත්කාලීන 4. පශ්චාත්කාලීන

(9) සිංහල හෝඩියේ .....පිළිබඳ බොහෝ විචාරකයන් අදහස් දක්වා ඇත.
1. පරිණාමය 2. පරිශීලනය 3. පරිවර්තනය 4. පරිග්‍රහණය

(10) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. අර්ධකාලීන, දුර්ලබ , ප්‍රවීන, පළමු
2. දර්ශනය, පරිමාණ , විශ්මය, විකාශණ
3. ලේඛණය, ප්‍රතිඵල, ප්‍රසංශාව, බහුශ්‍රැත
4. විශිෂ්ට, ශීඝ්‍රගාමී, සම්ප්‍රදාය, කනිෂ්ඨ

(11) රුවල, ජාලය, වීණාව, යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
1. කෙටි පාපිල්ල, ඇලපිල්ල, දීර්ඝ ඇදපිල්ල , දීර්ඝ ඉස්පිල්ල
2. කෙටි පාපිල්ල, ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ ඇදපිල්ල
3. ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ ඇද පිල්ල, කෙටි පාපිල්ල
4. කෙටි පාපිල්ල, දීර්ඝ ඇද පිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇලපිල්ල

(12) **තරාදිය** යන පදයෙහි අන්තර්ගත ව්‍යංජන අක්ෂර වර්ග වනුයේ,
1. ඕෂ්ඨජ, දන්තජ, මූර්ධජ
2. තාලුජ, දන්තජ, කණ්ඨජ
3. දන්තජ, මූර්ධජ, තාලුජ
4. මූර්ධජ, ඕෂ්ඨජ , තාලුජ

(13) අකාරාදී පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
1. කලියුගය, ගම්පෙරළිය, යුගාන්තය, විරාගය
2. කැලැහඳ, අඹ යහළුවෝ, මළවුන්ගේ අවුරුදු දා, ගොළු හදවත
3. මඩොල් දූව, විලම්බිත, තිලක හා තිලකා, දෛවයෝගය
4. චරිත තුනක්, අක්කර පහ, වරදත්ත, යළි උපන්නෙමි

(14) අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. සිවුපාවුන්, කුරුල්ලෝ, කුහුඹුවෝ, මීමැස්සෝ
2. වෘක්ෂයන්, තාරකාවෝ, පුෂ්පයන්, ලතාවෝ
3. කම්කරුවෙක්, ගැහැනියක්, සමහරෙක්, උපාසිකාවක්
4. ඇතැමුන්, තොප , මෑණියන්, ලේඛිකාවක

- අංක 15 සිට 20 තෙක් ප්‍රශ්නවල **<u>තද කළු අකුරෙන් මුද්‍රිත</u>** කොටසේ **<u>අර්ථය නිවැරදි</u>** ව දැක්වෙන වරණය තෝරන්න.

(15) **<u>අඛණ්ඩ ව</u>** ව්‍යායාම කිරීම ශාරීරික නිරෝගීභාවයට හේතු වේ.
1. අවුල් සහගත 2. නොබිඳුණු 3. නොකඩවා 4. වරින්වර

(16) කවීහු පද්‍ය නිර්මාණයේ දී පද **<u>සුසංයෝජනයෙන්</u>** කාව්‍ය රසවත් කරති.
1. මැනවින් සංශ්ලේෂණය කිරීම
2. මනා අවබෝධයෙන් යුතු ව භාවිත කිරීම
3. මැනවින් සංයෝජනය කිරීම
4. මැනවින් සම්බන්ධ කිරීම

(17) ඔහුගේ දේශනයේ දී **<u>හසළත්වය</u>** ප්‍රකට විය.
1. කාලයට ගැළපෙන 2. නිපුණත්වය 3. ගැඹුරු බව 4. පුදුම සහගත බව

(18) **<u>සබවස</u>** කුලුණු මෙත් මුදිතා දහම් සැම
1. සත්‍ය වචන 2. කරුණාව 3. සියලු සම්පත් 4. සතර සංග්‍රහ වස්තු

(19) නාහිමියන් ශාසන **චිරස්ථිතිය** උදෙසා කළ කාර්ය අපමණ ය.

1. බොහෝ කාලයකට
2. කෙටි කාලයක් පැවැත්මට
3. නූතනයේ පැවැත්මට
4. බොහෝ කල් පැවැත්මට

(20) හෙළ සංස්කෘතියේ විශිෂ්ටත්වය **ප්‍රතීයමාන** වන කලා නිර්මාණ බොහෝ ය.

1. සංරක්ෂණය වන
2. හැඟවෙන
3. දීප්තිමත් වන
4. ස්ථාවර වන

(21) දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

1. අම්බරුවන්, සේරංගාව, කලවිට, උප්පිඩි
2. සකපෝරුව, මැටිකෝව, කුම්භය, කුඹල්කරුවා
3. ප්‍රේක්ෂකයා, නාවිකයා, විචාරකයා, ශ්‍රාවකයා
4. ආතුරයා, ගුරුන්නාන්සේ, විලක්කුව, යාතිකාව

(22) එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ගඟුලැල්- ගංගා තරු- තුරු කනක- රන් පොත- ගත
2. මුහුණ- වත අඹ - ජලය සියොතුන් - සකුණ පඬේරු- ඕලු
3. භය- හස්තියා දිළිඳු- දුප්පත් ජනනී- මව චක්‍රය- රෝදය
4. ප්‍රහර්ෂය- සතුට දොම්නස- සොම්නස ඉක්මන්- සෙද භයානක - භීම

(23) මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. ප්‍රසිද්ධ - පසිඳු, පුවතර, ප්‍රකට, පරිසිදු
2. ජලය - දිය, අඹ, නිරුදක, වතුර
3. වනය - අරණ, වල, කැලෑව, වනාන්තරය
4. රන් - ස්වර්ණ, කසුන්, කාංචන, කනක

(24) **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

1. අනුගාමී - ප්‍රතිගාමී
2. නිශ්චල - චංචල
3. සොම්නස - සතුට
4. ස්වාධීන - පරාධීන

(25) **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

1. "ර්" අකුරට පසු ව යංශය යෙදීම වැරදි ය.
2. අතීත කෘදන්ත ප්‍රත්‍යවල යෙදෙන "ණ" මූර්ධජ වේ.
3. තාලුජ "ශ" කාරයට පසුව "න" යෙදේ.
4. සඤ්ඤක අකුරකට පෙර යෙදෙන "ල" කාරය අනිවාර්යයෙන් ම මූර්ධජ විය යුතු ය.

(26) සින්ධුපමාන වැව් තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා හමා - සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නෙ උන් හෙළු ප්‍රාණ වායුවයි.

ඉහත ගීත කණ්ඩයෙන් පැහැදිලි වන්නේ,

1. අතීතයේ වීර මී මුත්තන් දිවි පිදුවේ අපේ අනාගත සෞභාග්‍යය වෙනුවෙනි.
2. ඔවුන් තැනූ වැව් මතින් සුළඟ හමන බව යි.
3. ඔවුන්ගේ ප්‍රාණ වායුව නිසා අපි නැවත පණ ලබමු.
4. ඔවුන් කෘෂිකර්මාන්තයෙන් දිවි ගෙවූ බව යි.

- අංක 27 – 30 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

(27) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ

1. අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම
2. ස්ථිර තීරණයක් නැතිව සිටීම
3. ආරක්ෂාවක් නැති ව සිටීම
4. අනවබෝධයෙන් කටයුතු කිරීම

(28) බල්ලගේ වැඩේ බූරුවා භාරගත්තා වගේ

1. කාර්යය නිසි ලෙස ඉටු කිරීම
2. අවුල් සහගත ව කටයුතු කිරීම
3. තමාට පැවරූ කාර්ය වෙන අයකුට පැවරීම
4. තමාට අයිති නැති කාර්යයක යෙදීම

(29) පාලු ගෙයි වළං බිඳිනවා වගේ

1. කිසිවකු නොමැති තැන ස්ව අභිමතය අනුව කටයුතු කිරීම
2. සතුටෙන් යම් කාර්යයක් කිරීම
3. අයිතිකාරයකු නැති දෙයක් නිදහසේ විනාශ කිරීම
4. ආරක්ෂාවට තැබූ දෙයක් විනාශ වීම

(30) බොරදියේ මාළු බානවා වගේ

1. තනතුරට නොගැළපෙන වැඩ කිරීම
2. පරීක්ෂාකාරී ව කටයුතු කිරීම
3. කරදරයක දී වඩාත් වාසි ලබා ගැනීම
4. අවසිහියෙන් කටයුතු කිරීම

(31) 'සන්සල නොව එහි පිළිරූ ලෙසිනේ' මෙහි "පිළිරූ ලෙසිනේ" යන්න,

1. රූපකාලංකාරයකි.
2. උත්ප්‍රේක්ෂාලංකාරයකි.
3. ස්වභාවෝක්ති අලංකාරයකි.
4. උපමාලංකාරයකි.

(32) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද නාට්‍යයක් **නොවන්නේ,**

1. මනමේ
2. සිංහබාහු
3. නරි බැනා
4. එලොව ගිහින් මෙලොව ආවා

(33) පහත සඳහන් ගී බණ්ඩයේ සිව් වැනි පදය තෝරන්න.

වහිනවා වහිනවා වහිනවා වහිනවා
ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා
කළු වලා කැළඹෙමින් මුදුන් වී නැගෙනවා
.....

1. වලාකුළේ රන් පාටට විදුලි කොටනවා
2. බින්දු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා
3. ආකාසේ හඬ තලමින් අකුණු හඬනවා
4. අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

(34) 'ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු' මෙහි 'කපනු' යන්න,

1. ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි.
2. විධි ක්‍රියාවකි.
3. අසම්භාව්‍ය ක්‍රියාවකි.
4. පූර්ව ක්‍රියාවකි.

- අංක 35 – 37 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍ය තෝරන්න.

(35) 1. ගුරුවරුන් සිසුන් පැසසූහ.
2. පුෂ්පයෝ විකසිත වෙයි.
3. දිනකර පෙරදිග අහසේ බබළයි.
4. ලේඛකයෝ ග්‍රන්ථ රචනා කරයි.

(36) 1. විදුහල්පතිතුමා ශිෂ්‍යයන් අමතයි.
2. සියොන්හු විසින් මිහිරි නාද පවත්වනු ලබයි.
3. කෙනෙකු පුවත්පත් කියවයි.
4. මැණියෝ පන්සලට ගියා ය.

(37) 1. අශෝක රජතුමා දැහැමි පාලකයෙකු විය.
2. ඕ තොමෝ ගමට ගියේ ය.
3. මිනිස්සු අවංක නොවන්නේ ඇයි?
4. සිසුහු පන්තියෙහි ඇත.

(38) උඹ මිනිහෙක් වෙයන් පුතේ
කුසගිනි වෙයි එක ම සතුරු
අඳුරට බිය වෙයන් පුතේ
හිරු එළියට බිය නොම වී...

මෙම ගීය ගයන්නේ,

1. ගෘෘෂා
2. අසඩක්
3. පොතේ ගුරු
4. සයිමන්

(39) පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවේ පෙරළී ඇත
මිදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ.

යන පද්‍ය කොටස ඇතුළත් පද්‍ය නිර්මාණයේ රචකයා වන්නේ,

1. විමල් දිසානායක ය.
2. කුමාරතුංග මුනිදාස ය.
3. සිරි ගුණසිංහ ය.
4. මහගම සේකර ය.

(40) පහත දැක්වෙන ප්‍රකාශයේ අදහස වඩාත් ම නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
නිර්මාණශීලී හා විචාරශීලී ලේඛකයා මුලින් ම සමාජයෙන් අත්දැකීම් ලබා ගනියි. එම අත්දැකීම ඔහු පරිකල්පනය කර ඔහුගේ අත්දැකීම සමාජයේ අත්දැකීමක් බවට පත්කරයි.

1. නිර්මාණශීලී ලේඛකයා අත්දැකීම හා පරිකල්පනය උපයෝගී කර ගෙන සාර්ථක නිර්මාණයක් සමාජයට දායාද කරයි.
2. ඔහු සතු අත්දැකීම නිර්මාණශීලී ව සමාජගත කරයි.
3. අත්දැකීමක් නැති තැන පරිකල්පනයක් ද නැත.
4. පරිකල්පනයක් නොමැති විට අත්දැකීමෙන් පලක් නැත.

(ල. 1 × 40 = 40

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය II	කාලය / நேரம் / Time

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

(1) (I) සිට (X) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. නූතන සිංහල වර්ණමාලාවේ ඇතුළත් ඝෝෂ අක්ෂර දෙකක් ලියන්න.

II. පහත සඳහන් ක්‍රියා පදවල ක්‍රියා මූලය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.
(අ) බලයි (ආ) රහමින්

III. පහත දැක්වෙන පදවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියා දක්වන්න.
(අ) පැල (ආ) පැළ

IV. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පද දෙකක් උපුටා දක්වන්න.
ඒ පිළිමය ස්වර්ණමය එකක් නොව රිදියෙන් ම තැනූ රන් ආලේපිත එකක් බව බොහෝ දෙනා යළි නිගමනය කළහ.

V. පහත සඳහන් වාක්‍ය සදොස් ය.නිදොස් කර ලියන්න.
(අ) ගුරුවරු ඇතැම් පාඩම් අත්හරිනු ඇත.
(ආ) පාසල් ශිෂ්‍යයෝ දෙදෙනකු එම නව නිර්මාණයට දායක වූහ.

VI. ප්‍රාදේශීය ව්‍යවහාර අනුව යෙදෙන පහත පද සඳහා පොදු ව්‍යවහාර පද ලියන්න.
(අ) අත්තප්පා (ආ) හීන් අත්තා

VII. වඩාත් ගැළපෙන පරිදි පළමු පදය හෝ දෙවැනි පදය සකස් කොට ලියන්න.
(අ) මධ්‍ය විදුහල (ආ) ශිල්ප සතර

VIII. පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) සෑම ආකාරයෙන් ම යහපත්
(ආ) නිර්මාණකරණයෙහි නිරන්තර ව යෙදීමෙන් ලබන ප්‍රාගුණ්‍යය

IX. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) ඔහු නිරන්තරයෙන් මා රකියි. (ආ) මම ඉඩ ලද සෑම විට ම පොත් කියවමි.

X. පහත වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය ලියා දක්වන්න.
පැමිණ සිටි සියලු ශිෂ්‍යයෝ හොඳින් ක්‍රීඩා <u>කර</u> ජය ලබා ඔල්වරසන් <u>දෙමින්</u> ප්‍රීතිඝෝෂා පැවැත්වූහ.

(2) පහත දැක්වෙන(අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද නිර්මාණය කළ යුතු ය.

(අ) නවීන තාක්ෂණය හා එහි විවිධ ක්ෂේත්‍ර දියුණු කර ගැනීමට විද්‍යාඥයින් වෙහෙසෙන්නේ එහි සාර්ථක යහපත් ප්‍රතිඵල සියලු ලෝකවාසීන්ට ලබාදීමේ අරමුණෙනි. එහෙත් ඒ දියුණුවට සමගාමී ව (සමාන ව නොවූවත්) එම ජයග්‍රහණ මානවයාගේ විනාශයට යොදා ගන්නා බවක් පෙනේ. වර්තමානයේ ද මෙය මහත් ව්‍යසනයක් වී ඇත. අන්තර්ජාලය, මුහුණුපොත පමණක් නොව, දියුණු තාක්ෂණික ක්ෂේත්‍රයක් වන කෘත්‍රිම බුද්ධිය ද වර්තමානයේ අවභාවිත කරන බව පෙනේ. තාක්ෂණය හා එහි ජයග්‍රහණ මිනිසාගේ අභිවෘද්ධියට යොදා ගත යුතු ය.

(ආ) වර්තමානයේ පාසල් අධ්‍යාපනයෙහි යොදා ගැනෙන විෂය අන්තර්ගතය, විෂය සංඛ්‍යාව හා නව විෂය ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කර එහි සාධනීය වෙනස්කම් කළ යුතු ය. නවීන ලෝකයේ අවශ්‍යතා වෙනුවෙන් සක්‍රීය මානව සම්පතක් ගොඩනැගීම අධ්‍යාපනයේ අරමුණු අතර ප්‍රමුඛ විය යුතු ය. එබැවින් නව විෂයයන් හඳුන්වා දී පාසල් අධ්‍යාපනය නව්‍යකරණය කළ යුතු ම ය.

(ඉ) මිනිස් ජීවිතයේ පැවැත්මට ජලය අත්‍යවශ්‍ය ය. ජලය යනු ස්වභාවධර්මය විසින් උරුම කර දෙනු ලැබූ වටිනා ම සම්පතකි. පැරැන්නෝ ජලය කළමනාකරණය කර ගනිමින් මතු පරපුරට ද ඉතිරි කළහ. එහෙත් අද වන විට මානවයාගේ දියුණුව සමග ජලය විනාශ වූ තරම පැහැදිලි වන සාධක රැසකි. වැඩි වැඩියෙන් පානීය ජල බෝතල් නිෂ්පාදනය කිරීම ම නිදසුනකි. විනාශ වූ වැව් පිළිසකර කිරීම, ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම, වාරිමාර්ග පද්ධතිය කළමනාකරණය මගින් මෙම ප්‍රශ්නයට සාධනීය, ගුණාත්මකව බවින් යුත් දියුණුවක් ළඟා කර ගත හැකි ය.

(ඊ) ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය වර්තමානයේ තම සේවාව පිටරටවලට ලබා දීම නව ප්‍රවණතාවකි. නිදහස් අධ්‍යාපනයේ නිර්මාණයක් ලෙස වටිනා මිනිස් සම්පත් ලෙස ගොඩනැගී තම සේවය රට වෙනුවෙන් දිය යුතු ම මොහොතේ උපන් රටින් බැහැර ව වෙනත් රටක දිවිගෙවීම පුද්ගලික ව ඔවුන්ට වාසිදායක වුවත් රටක් ලෙස අපට එය විශාල පාඩුවකි. මෙලෙස රට හැර යාම පිළිබඳ වගකීම රජය ද භාරගත යුතු ය. කෙසේ වුව ද මේ තරුණ ශ්‍රමය ලංකාවේ දියුණුව වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

(3) පහත සඳහන් පාඨය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. (ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.)

ජපන් සංස්කෘතිය හා සෙන් දහම සමඟ සමීපයෙන් බැඳුණු ප්‍රබල සෞන්දර්ය නිර්මාණ මාධ්‍යයක් ලෙස හයිකු කවි හඳුන්වා දිය හැකි ය. හයිකු කවි ප්‍රථමයෙන් ම නිර්මාණය වූයේ ගෙන්රොකු අවධියේ පසුභාගයේ දී ය. ආරම්භයේ දී හයිකු හඳුන්වා ඇත්තේ "හොක්කු" නමිනි. කවීන් දෙදෙනෙකු හෝ කීප දෙනෙකු එකතු වී නිර්මාණය කළ දීර්ඝ කාව්‍යයක ප්‍රවීණතම පද්‍ය රචකයා පළමු 5, 7, 5 මාත්‍රාවලට අදාළ ව පාද තුනකින් ආරම්භක පද්‍ය රචනා කරන අතර එය 'හොක්කු' ලෙස නම් කර තිබේ. ඉන් පසු දෙවැනි කවියා මාත්‍රා හතකින් යුත් දෙවැනි පාද දෙකක් ද සෙසු කවීහු පරිවාර පද්‍ය ද රචනා කරති. බාෂෝ විසින් මුලින් ම එන පාද තුනේ කාව්‍ය ආකෘතිය අනුගමනය කරමින් කෙටි පද්‍ය නිර්මාණය කරන ලදී. මුලින් ම හයිකු ලෙස මෙම කෙටි කාව්‍ය නම් කරන ලද්දේ 19 වන ශත වර්ෂයේ ය. එනම්, මෙයිජී යුගය නියෝජනය කරන ජපන් ලේඛකයකු හා කවියකු වන ඔසඔකා ෂිකි විසිනි.

සෙන් බුදු දහම ඇසුරෙන් නිර්මාණය වූ හයිකු කවි මගින් ගැඹුරු කාව්‍යමය අනුභූතියක් ඉතා සංක්ෂිප්ත ව ඉදිරිපත් කෙරේ. බොහෝමයක් සෙන් ගුරුවරුන් සිය කවි සිතුවිලි, කඩදාසිය මත කළු පැහැති තීන්ත සහ පින්සල යොදා ගනිමින් කලාත්මක ජපන් අක්ෂරවලින් ලියා ධ්‍යානයකට සම වැදී අයුරින් එදෙස බලා සිටින්නට ඇත.

(4) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'මිතුරා' යන සිංහල වචනය හැදෙන්නේ 'මිත්‍ර' යන සංස්කෘත වචනයෙනි . මිතුරාගේ ස්වභාවය වූ කලී මෛත්‍රියෙන් යුක්ත වීම යි. මෛත්‍රිය ඇති තැන ආත්මාර්ථයට ඉඩක් නැත. එහෙයින් මිතුරා තුළ පැවැතිය යුත්තේ දයාවෙන් තෙත් වූ හදවතකි. මිතුරා උදෙසා සංස්කෘත භාෂාවේ වචන රැසක් භාවිත ය. සුහෘත්, සඛා, බන්ධු, වයස්‍ය, ස්නිග්ධ, ප්‍රියකෘත්, හිතකාරී, ප්‍රණෘසී සහ ස්නේහී ඉන් කිහිපයකි. මේ වචන සුහද බව, මිතුරු බව, ඥාතීත්වය, සිනිදු බව, ප්‍රිය වූවක් ම කරන බව, හිතවත් වූවක් ම කරන බව, ආදරණීය බව ආදී හැඟීම් ප්‍රකාශ කරයි. ප්‍රෙඩ්රික් නීට්ෂේ නම් දාර්ශනිකයා විසින් පෙන්වා දී ඇති පරිදි මිත්‍රයෝ නිබඳ එකිනෙකාට පාඩම් වන පරිද්දෙන් ක්‍රියා කළ යුතු වෙති. එසේ ම එකිනෙකා විවේචනය කළ යුතු අතර ඔවුනොවුන් වැරදිවලින් මුදවා ගැනීමට උත්සාහ කළ යුතු වෙති.

I. මිතුරාගේ මූලික ම ලක්ෂණය කුමක් ද?

II. 'මිතුරා' යන්නට සංස්කෘත භාෂාවේ යෙදෙන පද දෙකක් ලියා දක්වන්න.

III. 'ප්‍රෙඩ්රික් නිට්ෂේ' ට අනුව මිතුරන් කටයුතු කළ යුත්තේ කෙසේ ද?

IV. මිතුරන් එකිනෙකා විවේචනය කරගත යුතු වන්නේ කුමක් සඳහා ද?

V. මිතුරකු තුළ පැවතිය යුතු නැති ලක්ෂණයක් ලෙස මෙහි දක්වා ඇත්තේ කුමක් ද?

(5) ඔබ ඉගෙනගන්නා පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පාසලට අවශ්‍ය පරිගණක විද්‍යාගාරයක් ඉල්ලා සිටිමින් දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ලිපියක් ලියන්න. විද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා/නායිකාව ඔබ යැයි සිතන්න.

නැතහොත්

පරිසරයට එකතු වන පොලිතින් විශාල පාරිසරික ගැටලු රැසක් සඳහා හේතුවෙයි. මේ තත්ත්වය පිළිබඳ දැඩි අවධානය යොමු කරමින් කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දීමට 'නේවර් ෆ්‍රෙන්ඩ්' සංවිධානය තීරණය කර ඇත. ඒ අනුව කඩදාසි, කාඩ්බෝඩ්වලින් සාදාගන්නා අසුරන කෝප්ප, විවිධ ප්‍රමාණයේ මලු, විසිතුරු භාණ්ඩ ආදී තවත් නිෂ්පාදන රැසක් වෙළෙඳපොළට හඳුන්වා දෙන අතර ඒ බව සඳහන් කරමින් සුදුස අත්පත්‍රිකාවක් සකස් කරන්න. 'නේවර් ෆ්‍රෙන්ඩ්' සංවිධානයේ කළමනාකරු ඔබ යැයි සිතන්න. (සුදුසු පරිදි ලිපිනය, දිනය ආදිය යොදාගත යුතු ය.)

PAST PAPERS WIKI

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය III	කාලය நேரம் Time	පැය 2 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

1) (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) " කිසි භයක් නො කරව; මාගේ ආනුභාව බලව"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථය රචිත යුගය නම් කරන්න.

(ආ) "ආනුභාව බලන්න යැයි පැවසුවේ කවරෙක් ද?

(ii) (අ) 'විලේජ් ඉන් ද ජංගල්' නවකතාව සිංහලයට අනුවර්තනය කළේ කවරෙක් ද ?

(ආ) ඔහු විසින් පරිවර්තනය කරන ලද වෙනත් කෘති දෙකක් නම් කරන්න.

(iii) පහත සඳහන් කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රැනි ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ

(අ) .....

(ආ) .....

(iv) "දේවයිනි, මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නොදනුම්හ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(ආ) මෙහි 'දේවයිනි' යනුවෙන් ආමන්ත්‍රණය කළේ කාට ද?

(v) (අ) ගුත්තිල කාව්‍යය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයේ ද?

(ආ) එහි රචකයා නම් කරන්න.

(vi) "මට තවත් කරදර කරන්ඩ මා එළවන්නේ ඇයි?"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුද?

(vii) එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා

(අ) මෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) මෙම කවිය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(viii) අනුවණකම් කෙළේ
ගුරුන් ගුණ සිහි නො කෙළේ
නද ඉන් නො පතළේ
අයස ම ය මුළු දියත පතළේ

(අ) මෙහි සඳහන් අනුවණකම කුමක් ද?

(ආ) මෙහි සඳහන් අනුවණකම් කළ තැනැත්තා කවුද?

(ix) (අ) ජාතක කතා ඇසුරින් රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

(ආ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ කුමක් ද?

(x) <u>වෙර</u> නැති දා ගහ ගත්තේ දිනන්ට ද
යුද ඇති දා නැති <u>කුග</u> කොස් කොටන්ට ද

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) සිංහල ජන කවියේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලියන්න. (ලකුණු 02×10= 20යි)

2) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) අසන රිසින් නයි කැල ඔසළෝයා
ඔවුන වෙත ම සිටිනා ගුරුළෝයා
වයන එ වෙණ නද ලොබ ම කළෝයා
එදින වයිර සිත සිහි නොකළෝයා

(අ) වෛර සිත් ඇති නොවූයේ කා හට ද?

(ආ) මෙම සතුන්ගේ හැසිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ii) පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයනට කළ මනා සත්කාර කොට හෙවත් මීයෙන් හැනූ විලඳ කවා, මී පැන් පොවා, බෙත් තෙලින් **<u>පියා සඟළ</u>** මැඩ, මොළොක් ඇතිරිලි අතුරන ලද රන් මැදිරියෙහි **<u>සතප්පා</u>**,

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) ගිරාපෝතකයාට කළ සත්කාර මොනවා ද?

(iii) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

(අ) මෙහි සඳහන් උපදේශයක් ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iv) "සෝෂා සහිත කලබල වීදිවලින් තැනි ගෙන සිටි පුංචි මැණිකා <u>ජන ශූන්‍ය</u> නිශ්චල ස්ථානයකට පැමිණීම ගැන <u>ආනන්දිත ව</u> එහි ඇන තියා හිඳ ගත්තා ය."

(අ) ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v) ගුත්තිල **<u>මහ</u>** **<u>සිපි</u>**
සක් දෙවි බසින් **<u>සැතපී</u>**
මින් දිනමැයි දැපී
බඹර තත පළමුවෙන් සිඳපී

(අ) ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) මුළු පද්‍යයේ ම අදහස සරල බසින් ලියන්න.

(ලකුණු 04×5= 20 යි)

Past Papers Wiki

3) **උම්මග්ග ජාතක** කතාවෙන්

(අ) මහෞෂධ පඬිතුමාගේ ස්ථානෝචිත ප්‍රඥාවත්,

(ආ) කේවට්ට බමුණාගේ කුයි උපායමාර්ගත්

නිරූපණය කෙරෙන අයුරු නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

(අ) සරල බස් වහර,

(ආ) වියත් වහර

උචිත අයුරින් භාවිත කිරීම හේතුවෙන් රසික සිත් තුළ **ගුත්තිල කාව්‍යය** විශිෂ්ට කාව්‍ය ග්‍රන්ථයක් ලෙස සනිටුහන් වී ඇති අයුරු නිර්දිෂ්ට කොටසින් **එක් කරුණකට උදාහරණ දෙක බැගින්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු15)

4) (අ) ගැමි බස් වහර යොදා ගැනීම,

(ආ) අවස්ථා නිරූපණය

සඳහා කතුවරයා දැක්වූ දක්ෂතාව **බැද්දේගම** නවකතාව ඇසුරෙන් **එක් කොටසකට උදාහරණ දෙක බැගින්** දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

(අ) යහපත් ජීවිතයකට අවශ්‍ය උපදෙස් සැපයීමත්

(ආ) උචිත කාව්‍යාලංකාර යොදා ගැනීමත්

ජන කවියෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති අයුරු **හානා භීය පානා අඩහැරෙන් දැනේ** පද්‍ය පන්තිය ඇසුරෙන් **එක් කරුණකට උදාහරණ දෙක බැගින්** දක්වමින් විමසන්න. (ලකුණු 15)

- 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5) ගැමි ජන ජීවිතයෙහි ඇති දුක්ඛිත බව පිළිබඳ තොරතුරු **බැද්දේගම** නවකතාවෙන් නිරූපණය වන අයුරු **උදාහරණ තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10)

6) වැත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය අවස්ථා නිරූපණයේ දී මැනවින් ප්‍රකට වන ආකාරය **ගුත්තිල වෙණ නද** කොටසින් **උදාහරණ තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු10)

7) පුද්ගලයාගේ සිතිවිලි හා වචන විනාශකාරී ලෙස භාවිත කිරීම නිසා සමාජයට හානි වන අයුරු **උම්මග්ග ජාතකයේ** නියමිත කොටසින් **උදාහරණ තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank